# සෙක්ස් සෙවීම ඇත්තටම ප්‍රශ්නයක් ද?

පසුගිය දිනක වැඩිපුරම සෙක්ස් හොයන්නේ හෝමාගම මිනිස්සු යනුවෙන් ලක්බිම පුවත්පතේ ලිපියක් පළ වී තිබුණි. (මෙහි දී අප රටියන් ප්‍රමුඛ ලෙස සෙවුම් කර ඇති බව කියැවෙන්නේ සෙක්ස් යන සෙවුම් වදන මිස පෝර්න් යන සෙවුම් වදන නොවේ. ඒ අනුව හුදෙක් කාම ප්‍රකාශනයන්ට නිරාවරණය වීමක් මින් පෙන්නුම් කරන බවක් නො පැවසිය හැකි වුවත් තත්ත්වය එය බව කිව හැකි ය.) බොහෝ මාධ්‍ය වාර්තාවන් මෙය දක තිබුණේ ශ්‍රී ලංකාවේ කීර්තියට හානි කරන තත්ත්වයක් ලෙසත් යොවුන් අයත් දරුවනුත් සම්බන්ධයෙන් භයානක ප්‍රතිඵලයක් ඇති කරන්නක් ලෙසත් ය. ශ්‍රී ලංකාවේ ඇතැම් සංස්කෘතික ලක්ෂණ හේතුවෙන් ජනතාවත් වෙසෙසින් ම යෞවනයනුත් අතර ලිංගිකත්ව ගුප්ත/කුතුහලය දනවන යමක් වී තිබීම මීට හේතු වූ සාධකය බව ද එහි සඳහන් වී තිබුණි.

මේ කාරණය පදනම් කරගනිමින් හෝ ලිංගිකත්ව අධ්‍යාපනයේ වැදගත්කම ගැන සංවාදයක් ඇතිවීම සතුටට කරුණක් වුවත් එවැනි වැලකුම් උපායික අරමුණකින් ඒ කෙරෙහි යොමුවීම එහි සාධනීයත්වය සීමා කිරීමට හේතුවන බව ද කිව යුතු ය. ලිංගිකත්ව අධ්‍යාපනය යනු ලිංගිකත්වය ආශ්‍රිත කාරණාවන් පමණක් ගැන කතා කෙරෙන්නක් නොවේ. එය සිය ස්ත්‍රීපුරුෂභාවයට අදාළ ව කෙනකු අත්කරගන්නා කායික මානසික ලක්ෂණ සහ වර්ධනය කරගත යුතු සමාජමය හැකියාවන් වැනි වූ පුළුල් විෂය පෙදෙසක් ඇසුරු කරන්නකි. ප්‍රජනනයත්, ලිංගික හැසිරීමුත් ආශ්‍රිත කරුණු යනු එහි එක් පරිච්ඡේදයක් පමණි. මෙකී අංශය සම්බන්ධයෙන් පාසල් පාදක අධ්‍යාපනය මෙන්ම සිසුන්ගේ දැනුත්භාවයද බේදජනක තත්ත්වයක පැවතියත් සිසුන්/ජනතාව කාමාස්වාදන දර්ශන කෙරෙහි යොමුවීම හුදෙක් ලිංගික දැනුවත්භාවය සොයා යාමේ ප්‍රතිඵලයක් ලෙස දැකීම ගැටලු සහගත ය. පොදුවේ කවර සමාජයකත් යෞවනයන් තුළ පමණක් නොව වැඩිහිටියන්ද තුළ දර්ශනාස්වාදයට ඇති ස්වාභාවික මෙන් ම සාමාන්‍ය වූ රුචිකත්වය හුදු ලිංගිකත්වය කුහුල් සහිත යමක් වීම නිසා ඇතිවන රෝගී තත්ත්වයක් ය යනුවෙන් දැකීම පිටුපස ඇත්තේ මෙවැනි ලිංගික පීඩිත සමාජයක් බිහි වීමට හේතු වූ සුචරිතවාදීත්වයට ඇති ආලයම නොවේ ද?

එමෙන් ම යොවුනනන්ගේ දර්ශනාස්වාදයට ඇති ස්වාභාවික (මැඩ පැවැත්විය නොයුතු) ආශාව ඊනියා දැනුවත්භාවයකින් ඉවත් කළ හැක්කක් නොවේ. දැනුවත්භාවය යනු විනෝදාස්වාදය වෙනුවට ආදේශ කළ යුත්තක් හෝ හැක්කක් නොව විනෝදාස්වාදයට අඩිතාලම දමන්නකි. වරප්‍රසාදිත ලිංගික අධ්‍යාපනය (mandatory sex education) තුළ වීඩියෝ දර්ශනද අධ්‍යාපන මෙවලමක් ලෙස යොදාගන්නා බව මොවුන් දන්නවාදැයි නොදනිමි. කාම ප්‍රකාශන නැරඹීමෙන් දරුවන්ට හෝ වැඩිහිටියන්ට කිසිදු සෘජු හානියක් සිදු වන බව තවම පර්යේෂණයකින් සොයාගෙන නැත. කෙසේ නමුත් ලිංගිකත්වය ගැන ඇති ආකල්පයන් සම්බන්ධයෙන් විශේෂයෙන් ලිංගික ප්‍රචණ්ඩත්වය අනුමත කිරීමත්, ස්ත්‍රීන් ලිංගිකමය භාණ්ඩයක් වසයෙන් දැකීමටත් නවයොවුන් වියැත්තෙකු ව පොළඹවන්නට නම් පුළුවන. එසේ ම ඔවුන්ගේ ලිංගික ජීවිතය කෙරෙහි ද බලපෑම් කරන්නටද පුළුවන. එහෙත් ඒ උදක් ම අහිතකර බලපෑමකැයි කීම නම් නොදන්නා කමකි.

අනෙක් අතට විසඳුම වන්නේ ලිංගිකත්වය සම්බන්ධව විවෘත ආකල්පයකින් යුතු සමාජයක් බිහිකිරීම නම් දර්ශනාස්වාදය ප්‍රචලිත වීම නැතිනම් කාමෝද්දීපක ප්‍රකාශන නිෂ්පාදනය මෙන්ම නීතිගතවීමද ලිංගික සංස්කෘතිය නවීකරණයට තල්ලුවක් මිස බාධකයක්ද නොවේ. එසේ නම් එය සමාජ ගැටලුවක් ලෙස දැකිය යුත්තේ මන්ද? පවතින සමාජ ගැටලුව ලිංගික පීඩනය නම් කාම ප ්‍රකාශන යනු ඊට මනා ඔසුවක් නොවන්නේ ද?

ලිංගික දැනුම මෙන්ම වින්දනයද යොවුනනන්ගේ පමණක් නොව පොදුවේ මිනිසුන්ගේ ස්වාභාවික ආශාවකි. අන්තර්ජාලයෙන් වැඩිපුර සෙවුම් කරන්නේ ආසියාතික අප්‍රිකානු රටවල් බව ඇත්තකි. ඒ තරම් කුහුලක් ඔවුන් තුළ ඇත්තේ ඔවුන්ගේ සමාජයන්හි ඇති ලිංගිකමය වාරණයන් නිසා බවද ඇත්තකි. නමුත් දියුණු ලිංගික සංස්කෘතියක් ඇති යුරෝපීය රටවල ජනතාව දර්ශනාස්වදයෙන් තොර වූවෝද? එය එසේ දැක්වීම වැරදි යැයි සිතමි. මා දන්නා තරමින් සෑම යුරෝපීය රටක ම පාහේ කාම ප්‍රකාශන නිෂ්පාදනයත්, අලෙවි කිරීමත් නීතිගත වී ඇත්තේ ය. එසේ ම ඒ සම්බන්ධයෙන් සමාජමය

වාරණයක් ද නොමැත්තේ ය. අප වැනි රටවල යොවුන් දරුවන් ද අනෙක් අය ද කාම ප්‍රකාශන අන්තර්ජාලයෙන් නරඹන්නේ එය මෙරට වෙන විදියකින් සපයාගත හැකි තරම් සුලබ දෙයක් නොවන බැවිනි. නමුත් ලිංගික කෙළිබඩුත්, කාම ප්‍රකාශනත් අලෙවි කරන වෙළඳසැල් තිබෙන යුරෝපයේත් ඇමෙරිකාවේත් මිනිසුන්ට එය අන්තර්ජාලයෙන් මැ සොයාගත යුතු තරම් දෙයක් නොවේ. මේ වාර්තාවල ඔවුන් නිසිලෙස පිළිබිඹු නොවන්නේ එනිසා නොවිය හැකි ද?

2004 වසරේ අගෝස්තු 8 සන්ඬේ ටයිම්ස් පුවත්පතේ porn is vital to freedom; says Rushdie නමින් ලිපියක් පළ වී තිබුණි. එහි දී සල්මන් රුෂ්ඩි සිය උපන් බිමද මේ තත්ත්වය ළඟාකරගෙන තිබීම ගැන විමසූ විට පවසා තිබුණේ මෙවැන්නකි. *කාම ප්‍රකාශන නැරඹීම ලෝකෙ හැමතැනම දකින්න පුලුවන් දෙයක්. නමුත් තරුණ තරුණියන් ට සබඳතා පවත්වන්නත් ඔවුන් ගේ රුචිය පරිදි හැසිරෙන්නත් බාධා කරන සමාජයක් තුළ එය ඊට වඩා විශාල සමාජ අවශ්‍යතාවයක් බවට පත් වෙනවා.* මේ ගැන තවදුරටත් අදහස් දක්වමින් හෙතෙම පවසා තිබුණේ සමාජයක නිදහසත් ශිෂ්ටත්වයත් මිනුම් විය යුත්තේ කාම ප්‍රකාශන අනුමත කිරීමට තරම් ඔවුන් දියුණු ද යන්න මත බවයි.

සචින්ත මදුෂාන්<br>
ගාල්ල